# PERICHONDRIAL CYST

1. බාහිර කණ සෑදී ඇත්තේ කාටිලේජ වලිනි. කාටිලේජය තුල රුධිර වාහිනි නොමැත. පෝෂණය ලබාගන්නේ කාටිලේජයට පිටතින් තදින් ඇලී පවතින පෙරිකොන්ඩ්‍රියම නම් සිව්යකිනි.
   ඔබගේ කණේ කාටිලේජය සහ පෙරිකොන්ඩ්‍රියම අතර තරලයක් එකතුවී ඇති නිසා, කාටිලේජයට පෝෂණය නොලැබී කණ විකෘති වීමේ අවදානමක් ඇත.



2. මේ තරලය ඉතා ඉක්මනින් ඉවත් කල යුතුය. කණේ සම නිර්වින්දනය කර, අඩ සඳ හැඩැති කුඩා කොටසක් ඉවත් කෙරේ. එවිට තරලය ඉවත්වී, නැවතත් පෙරිකොන්ඩ්‍රියම කාටිලේජයට සමීප වන නිසා එහි පෝෂණය යථා තත්වයට පත්වේ. මෙම කැපුමට බෙහෙත් ගල්වා, කණ වටා බැන්ඩේජයක් දින 5ක් ඔතා තබනු ඇත.

3. මේ කාලය තුලදී ඔබට ප්‍රතිජීවක සහ වේදනා නාශක ලබාදෙනු ඇත. බැන්ඩේජය තද වැඩිනම් වහාම වෛද්‍යවරයාට දැන්විය යුතුය.

4. දින 5කට පසුව බැන්ඩේජය ඉවත් කලවිට කණ යථා තත්වයට පත්ව තිබෙනු දැකිය හැක.
   සමහර විට දිනක් හෝ දෙකක් තුවාලයට බෙහෙත් දමා ගැනීමට සිදු වේ.